// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2451/23 – 2025 අගෝස්තු මස 27 වැනි බදාදා – 2025.08.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/04/2023/232

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.11.09 දිනැති හා අංක 2409/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.10.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතර වේරදූව, සිරි ආරියවංශ මාවත, "සෙවන" ලිපිනයෙහි පදිංචි සී. ජේ. විජේවීර මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/54/2024 හා 2025.07.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025, අගෝස්තු මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ අංශය**

යොමු අංකය : IR/COM/04/2023/232
නඩු අංකය : A/54/2024

සී. ජේ. විජේවීර මයා,
"සෙවන",
සිරි ආරියවංශ මාවත,
වේරදූව,
මාතර.

පළමු පාර්ශ්වය

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

දෙවන පාර්ශ්වය

අධිකරණ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, ද විලේජ්, අංක 202/බී/61 හි පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිලාගේ ජයවික්‍රම වන මා 2024.10.28 දින පත් කොට මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ IR/COM/04/2023/232 හා 2024.10.16 දිනැති ලිපියෙන් ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වශයෙන් " ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කරන සී. ජේ. විජේවීර මහතාට එම අධිකාරියේ කොට්ඨාස කළමනාකාර තනතුරට පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ දී අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ." යනුවෙන් යොමුව දක්වා ඇත.

ඒ අනුව දෙපාර්ශ්වයම 2024.11.27 වන දින බේරුම්කරණ විභාගය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයට කැඳවූ අතර පිළිවෙලින් 2024.12.15, 2025.01.16, 2025.02.13, 2025.04.04, 2025.05.28 හා 2025.06.05 යන දින විභාගය පැවැත්වූ අතර ලිඛිත දේශන සඳහා 2025.06.20 දින ලබා දෙන්නට විය.

මෙම බේරුම්කරණ විභාගය ආරම්භ කළ දින එනම් 2024.11.27 වන දින දෙපාර්ශ්වයටම බේරුම්කරණ විභාගය පවත්වා ගෙන යන ආකාරය පැහැදිලි කර දුනිමි. ප්‍රථමයෙන් ම කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාදී ඇති යොමුව පිළිබඳව පළමු වන පාර්ශ්වකරුට පැහැදිලි කර දුන් අතර යොමුව නිවැරදි බව ඔහු පිළිගත් අතර දෙපාර්ශ්වයම මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් වෙනත් අධිකරණයක නඩුවක් නොපවතින බව ද කියා සිටින ලදී. එමෙන්ම පාර්ශ්වයන් අතර හැකි තරම් එකඟතාවයකින් බේරුම්කරණය අවසන් කිරීමටත් එසේ නොවන අවස්ථාවක දී පමණක් සාක්ෂි විමසීම, ලේඛන ගොනු කිරීම, ප්‍රකාශ සටහන් කිරීම කරන බවත් පාර්ශ්වකරුවන්ට පැහැදිලි කර දෙන ලදී.

මෙම බේරුම්කරණ විභාගය ආරම්භයේ දී දෙපාර්ශ්වයටම දන්වා සිටියේ පළමු වන පාර්ශ්වය මෙම විභාගය පවත්නා අවස්ථාව වන විටත් මහවැලි අධිකාරියේ සක්‍රීය සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරියෙකු බැවින් හැකි තරම් එකඟතාවයෙන් හා සාකච්ඡා මට්ටමින් මෙම ආරාවුල නිරවුල් කර ගන්නා ලෙසය. කෙසේ වෙතත් එවැනි එකඟතාවයකින් ආරාවුල සමථයක් නොවීම හේතුවෙන් දෙපාර්ශ්වයටම ලේඛන ගොනු කිරීමට හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දුනිමි.

පළමු පාර්ශ්වකරුගේ නියෝජිත මහතා මෙම ප්‍රශ්නගත ආරාවුල සම්බන්ධයෙන් පැහැදිලි කරමින් පළමු වන පාර්ශ්වයේ සී.ජේ.විජේවීර මහතා මහවැලි අධිකාරියට 2005.07.15 වන දින සංවර්ධන සහකාර ලෙස සේවයට බැඳී ඇති බවත් ඉන්පසු 2012.12.16 (මෙම දිනය වැරදිය නිවැරදි දිනය 2013.06.12 විය යුතුය.) දින ව්‍යාපාර සංවර්ධන නිලධාරි ලෙස උසස්වීමක් ලබා ඇති බවත්, අනතුරුව අවස්ථා කීපයක දීම උසස් වීම් සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ නමුත් ඔහුට සහනයක් නොලැබුණ බවත්, 2021.07.31 දින කොට්ඨාස කළමනාකරුවන් බඳවා ගැනීමේ දී ඉල්ලුම් කළ නමුත් සියලු සුදුසුකම් සපුරා තිබිය දී එය අහිමිවීමෙන් බලවත් අසාධාරණයක් සිදුවූ බව කියා සිටි. ඒ අනුව පළමු වන පාර්ශ්වය ඇඹිලිපිටිය කම්කරු කාර්යාලයට සහ අවිස්සාවේල්ල කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යාලයට පැමිණිලි කිරීමෙන් අනතුරුව පැවැති පරීක්ෂණ වලින් සාධාරණයක් ඉටු නොවීම නිසා නාරාහේන්පිට කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශයේ දී තම පැමිණිල්ල විභාග කරන ලද නමුත් එහි දී ද සහනයක් නොලැබීම හේතුවෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ පරිදි බේරුම්කරණය මගින් නිරවුල් කිරීමට මෙම අංශයට යොමු කරන ලද බව කියා සිටී.

කොට්ඨාස කළමනාකරුවන් බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදී ඇති ආකාරය දැක්වෙන විස්තරාත්මක ලේඛනය දෙවන පාර්ශ්වය විසින් ගෙන්වා ගත් අතර එම ලේඛනයත් කොට්ඨාස කළමනාකරුවන් බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීමේ පටිපාටියත් පරීක්ෂා කළෙමි.

කොට්ඨාස කළමනාකරුවන් බඳවා ගැනිමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ඇති අතර එම බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් පහත පරිදි වේ.

01. කොට්ඨාස කළමනාකාර II ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම් වනුයේ, පහත සුදුසුකම් I හෝ II වේ.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු කෘෂිකර්මාන්ත, ග්‍රාම සංවර්ධන සහ ඉඩම් පරිපාලනය විෂය ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ වසර 5 ක සේවා පළපුරුද්ද. (මින් වසර 2 ක් කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.)

II. කණිෂ්ඨ කළමනාකාර JM 1-1 සේවා ගණයේ හි කෘෂිකර්ම, වාරි මාර්ග, ඉඩම්, ආයතන සංවර්ධන, ව්‍යාපාර සංවර්ධන සහ පරිපාලන විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

බේරුම්කරු වශයෙන් මා පළමු වන පාර්ශ්වයෙන් පැහැදිලි කර ගනු ලැබුවේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ ආකාරය පැහැදිලි කර දෙන ලෙසය. ඒ අනුව ඔහු කියා සිටියේ 2021 දී කොට්ඨාස කළමනාකරු තනතුරට අදාළ ඉල්ලුම්පත්‍ර කැඳවීම ප්‍රධාන කාර්යාලය සිදු කරන බවත් ඊට අදාළ දැන්වීම් ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රදේශීය කාර්යාලවල ප්‍රදර්ශනය කළ බවත් ඒ අනුව තමන් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ අතර රට තුළ පැවැති කොරෝනා වසංගත රෝග තත්වය හේතුවෙන් මෙම සම්මුඛ පරීක්ෂණය පැවතියේ ZOOM තාක්ෂණය ඔස්සේ බවත්ය. තමා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාව වන විට බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳව දැනුවත් නොවූ බව ද ඒ අනුව තමා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරනු ලැබුවේ බඳවා ගැනීමේ පටිපාටියේ දැක්වෙන සුදුසුකම් I යටතේ ද නැත්නම් සුදුසුකම් II යටතේ ද යන්න පිළිබඳව අවබෝධයකින් තොරව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ බවත් කියා සිටී. ZOOM තාක්ෂණය ඔස්සේ සම්මුඛ පරීක්ෂණය පැවැති හෙයින් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ද තමා කොට්ඨාස කළමනාකරු තනතුරට සුදුසුකම් ලබන්නේ සුදුසුකම් I යටතේ ද සුදුසුකම් II යටතේ ප්‍රශ්න නොකළ බවත් වැඩිදුරටත් කියා සිටී. සම්මුඛ පරීක්ෂණයෙන් පසු තමාට වඩා අඩු සේවා පළපුරුද්දක් ඇති නිලධාරින් කොට්ඨාස කළමනාකරුවන් වශයෙන් තෝරාගත් නමුත් 2005 වසරේ සේවයට බැඳුන තමන්ට එම අවස්ථාව අහිමි වූ බවත් කියා සිටී.

දෙවන පාර්ශ්වය කියා සිටින්නේ මෙම සම්මුඛ පරීක්ෂණය පැවැතියේ 2021.07.31 හා 2021.08.01 දින ZOOM තාක්ෂණය ඔස්සේ බවත් එය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයෙක්ගේ සභාපතිත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කළ අතර මහවැලි අධිකාරියේ කිසිදු නිලධාරියෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නියෝජනය නොකළ බවයි. එම නිසා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබාදී ඇති ආකාරය විග්‍රහ කිරීම සිදු කළ හැක්කේ නිරීක්ෂණය කිරීමෙන් පමණක් බවත් ඒ හැර ලකුණු ලබාදී ඇති ආකාරය පිළිබඳව විමසීමක් කිරීමේ ප්‍රායෝගික හැකියාවක් නොමැති බවත් කියා සිටි. කෙසේ වෙතත් ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව පළපුරුද්ද සඳහා ලකුණු 30 ක් ද අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 30 ද කුසලතා හා කාර්ය සාධනය සඳහා ලකුණු 15 ද සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 25ක් ද අනුමතකර තිබුණ අතර පළමු වන පාර්ශ්වයට පළපුරුද්ද සඳහා ලකුණු 15 ක්ද අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 3 ක් ද කුසලතා හා කාර්ය සාධනය සඳහා ලකුණු 15 ක් ද සම්මුඛ පරීක්ෂණය ඉදිරිපත් කිරීම සඳහා ලකුණු 23ක් ද වශයෙන් ලකුණු 56 ක් හිමිවී තිබේ. කුසලතා හා කාර්ය සාධනය සඳහා වෙන්කළ ලකුණු 15 න් ලකුණු 15 ම ලබාදී ඇති අතර සම්මුඛ පරීක්ෂණයේ ඉදිරිපත් කිරීම සඳහා ලකුණු 25 න් 23 ක් ලබාදී ඇත. ඒ අනුව පළමු වන පාර්ශ්වකරුට අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 30 න් 3 ක් හිමි වී තිබීමත් පළපුරුද්ද සඳහා ලකුණු 30 න් 15 ක් හිමිවී තිබීම මෙම බේරුම්කරණ විභාගයේ විසඳිය යුතු ගැටලුව වශයෙන් හඳුනාගතිමි.

ඒ අනුව මා දෙපාර්ශ්වයට දන්වා සිටියේ ලිඛිත ඉදිරිපත් කිරීම්වල දී පළපුරුද්ද වෙනුවෙන් හා අතිරේක අධ්‍යාපන සුදුසුකම් වෙනුවෙන් ලකුණු ලබාදුන් ආකාරය / ලකුණු ලැබිය යුතු ආකාරය පිළිබඳව පැහැදිලි කරමින් තම ප්‍රකාශය ඉදිරිපත් කරන ලෙසයි.

පළමු වන පාර්ශ්වය තමන්ට අසාධාරණයක් වූ බව දිගින් දිගටම කියා සිටිය ද එම අසාධාරණය ලකුණු ලබාදීමේ කුමන ක්ෂේත්‍රය යටතේ සිදුවූයේ ද යන්න පැහැදිලි කර දීමට අපොහොසත් වී ඇත. පළමු වන පාර්ශ්වකරු මෙම කොට්ඨාස කළමනාකරණ තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් I හෝ සුදුසුකම් II අතුරින් තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහලම ලකුණු ලබාගත හැකි සුදුසුකම් යටතේ ඉල්ලුම් කළ යුතු බව හෝ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ලකුණු ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳව අවබෝධයකින් තොරව ඉල්ලුම් කළ බව මුලදී මෙම විභාගය ආරම්භ කළ මුල් අවස්ථාවේ දී පිළිගන්නට යෙදුනි. එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ද තමාට ලකුණු ලබා දුන්නේ සුදුසුකම් I යටතේ ද II යටතේ ද යන්න පිළිබඳ සඳහනක් නොකළ බවත්, මුල් අවස්ථාවේ දී ප්‍රකාශ කර ඇත. නමුත් මෙම විභාගය අවසන් වන විට පළමු පාර්ශ්වකරු වෙනුවෙන් ඔහුගේ නියෝජිත කියා සිටියේ සම්මුඛ පරීක්ෂණයේ දී පළමු වන පාර්ශ්වකරුට ලකුණු හිමි විය යුත්තේ සුදුසුකම් II යටතේ බවයි. නමුත් සුදුසුකම් II යටතේ හිමි විය යුතු ලකුණු ප්‍රමාණය නිවැරදිව ගණනය කර ඉදිරිපත් කරන ලෙසට නියෝජිත තැනට මා අවස්ථා දෙකක දී දන්වා සිටිය ද එය නිවැරදිව ගණනය කිරීමට නොහැකි විය. පළමු පාර්ශ්වකරුට සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් II යටතේ ලකුණු ලබා දෙන්නේ නම් හිමිවිය යුතු මුලු ලකුණු සංඛ්‍යාවත් සුදුසුකම් I යටතේ ලකුණු ලබා දෙන්නේ නම් හිමිවිය යුතු මුලු ලකුණු සංඛ්‍යාවත් යන දෙකම ගණනය කිරීමට පළමු පාර්ශ්වකරුට හෝ ඔහුගේ නියෝජිතට හැකියාවක් නොවීය.

මේ නිසා දෙවන පාර්ශ්වය සිය ලිඛිත දේශන වලදීත් ඊට පෙර අවස්ථා වලදී ත්, දන්වා ඇත්තේ පළමු වන පාර්ශ්වයට සිදු වූ අසාධාරණය කුමක් ද යන්න පිළිබඳව පැහැදිලි කිරීමට පළමු පාර්ශ්වකරුට නොහැකි වූ බවයි. මේ නිසා අපැහැදිලි සහ පැහැදිලි නොකළ අසාධාරණයක් පිළිබඳව සහනයක් ඉල්ලිය නොහැකි බව ඔවුන්ගේ ලිඛිත දේශන වලින් අදාළ නඩු තීන්දු සමග ඉදිරිපත් කර සිටී.

දෙවන පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණ විභාගය ආරම්භ වූ අවස්ථාවේ සිට කියා සිටින්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පළමු පාර්ශ්වකරුට මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදී ඇත්තේ සුදුසුකම් I යටතේ බවයි. එම ස්ථාවරය ආරම්භයේ සිට අවසානය දක්වාම එකම ආකාරයෙන් දෙවන පාර්ශ්වය කියා සිටී.

ඒ අනුව ඔවුන් කියා සිටින්නේ සුදුසුකම් I යටතේ දැක්වෙන පරිදි පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය මූලික සුදුසුකමක් සේ සලකන හෙයින් එම උපාධිය සඳහා ලකුණු ලබාදිමක් සිදු නොවන බවයි. එය නිවැරදිය. සුදුසුකම් I යටතේ පළපුරුද්ද සම්බන්ධයෙන් දැක්වෙන්නේ “උපාධිය ලබා ගැනිමෙන් පසු කෘෂිකර්මාන්තය, ග්‍රාම සංවර්ධනය, ඉඩම් පරිපාලනය විෂය ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ වසර 5 ක සේවා පළපුරුද්ද මින් වසර 2 ක් කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.” යනුවෙන් දැක්වෙන පළපුරුද්ද සඳහා ලකුණු ලබාදීමේ දී දෙවන පාර්ශ්වය නිසි පරිදි ලකුණු ගණනය කර ඇද්ද යන්න ප්‍රශ්නගතය.

දෙවන පාර්ශ්වය විසින් 2025.02.11 වන දින ඉදිරිපත් කළ පළමු ප්‍රකාශයේ 9(අ) ඡේදයෙන් ද ඔවුන්ගේ 2025.04.02 වන දිනැති ප්‍රතිවිරෝධතාවයේ 2 (ඌ) ඡේදය යටතේ ද කියා සිටින්නේ “ සම්මුඛ පරීක්ෂණය සඳහා අයඳුම්පත් කැඳවන අවසන් දිනට පළමු පාර්ශ්වය විසින් JM1-1 සේවා ශ්‍රේණිය යටතේ වසර 7 ක් සම්පූර්ණ කර ඇති අතර එම වසර 7 න් වසර 2 ක් මූලික සුදුසුකම් සඳහා අඩු කර ඉතිරි වසර 5 සඳහා එක් වසරකට ලකුණු 3 බැගින් අදාළ පළපුරුද්ද සඳහා ලකුණු 15 ක් ලබාගෙන ඇති බවත්ය” යනුවෙනි.

ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් ප්‍රකාශ කරන පරිදි අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් I යටතේ පළමු පාර්ශ්වකරුට ලකුණු ලබාදීම සිදුකර ලැබ ඇත්නම් එහි දී ඔහුගේ පළපුරුද්ද වෙනුවෙන් ලකුණු ලබාදී ඇති ආකාරය දෝෂ සහගතය. දෙවන පාර්ශ්වය පළපුරුද්ද සඳහා සේවා කාලය ගණනය කර ඇත්තේ සුදුසුකම් I යටතේ කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා කාලය පමණි. සංවර්ධන සහකාර වශයෙන් පළමු වන පාර්ශ්වකරුගේ සේවා කාලය ගණනය කර නොමැත.

ඒ අනුව අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් යටතේ සේවා පළපුරුද්ද සඳහා ලකුණු ලබාදිය යුත්තේ පහත පරිදිය.

01. 2005.07.15 දින සිට 2013.06.12 දක්වා සංවර්ධන සහකාර වශයෙන් සේවය කළ මුලු කාලය අවුරුදු 7 යි මාස 10 යි දින 27 කි.

02. 2013.06.12 සිට ව්‍යාපාර සංවර්ධන නිලධාරි වශයෙන් (JM 1-1) 2020.09.25 දින දක්වා (ඉල්ලුම්පත් බාරගත් අවසන් දිනය) දක්වා සේවා කාලය අවුරුදු 7 යි මාස 03 දින 13 යි.

    මුලු සේවා කාලය (1+2 අවුරුදු 15 යි මාස 2 යි දින 10 කි)

ඉහත සේවා කාලයෙන් බඳවා ගැනිමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සඳහා වසර 5ක් අඩු කළ පසු සේවා කාලය. (JM 1-1 න් වසර 2 ක් ද ඇතුළත්ව) වසර 10 යි මාස 2 යි දින 10 කි.

ඒ අනුව පළමු වන පාර්ශ්වකරුට සිය සේවා පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 3 බැගින් වසර 10 ක් සඳහා ලකුණු 30ක් හිමි විය යුතු වේ. ඒ අනුව අනුමත බඳවා ගැනිමේ පටිපාටියේ පළපුරුදු සඳහා වෙන්කර ඇති සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ඔහු වෙත හිමිවිය යුතුය.

පළමු පාර්ශ්වකරුට පළපුරුද්ද සඳහා ලකුණු 15 වෙනුවට ලකුණු 30 ක් හිමිවේ නම් ඔහුගේ මුලු ලකුණු සංඛ්‍යාව ලකුණු 56 සිට 71 දක්වා ඉහලට යන අතර ඔහු ලකුණු ලේඛනයේ 3 වන ස්ථානය ලැබීමට හිමිකමක් තිබුණ බව තීරණය කරමි.

මෙම ප්‍රදානය ලබාදීමේ දී පළමු වන පාර්ශ්වකරුට 2024.09.25 වන දින සිට මහවැලි අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ වශයෙන් උසස්වීමක් ලබා MM 1-1 සේවා ගණයේ තනතුරක් ලබා තිබිමත් කොට්ඨාස කළමනාකරණ තනතුර ද MM 1-1 ගණයේ සේවයක් වන හෙයින් මෙම ප්‍රදානය හේතුවෙන් වෙනත් වෘත්තීමය ගැටලුවක් මතු නොවන බවත් සැලකිල්ලට ගතිමි.

මේ අනුව කොට්ඨාස කළමනාකරණ තනතුර පළමු වන පාර්ශ්වකරුට හිමිවිය යුතු බවත් සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී කොට්ඨාස කළමනාකාර තනතුරට තෝරාගත් නිලධාරීන්ට එකී තනතුර 2021.08.10 දින සිට ලබාදී ඇති බැවින් පළමු වන පාර්ශ්වකරුට ද එදින සිට කොට්ඨාස කළමනාකරණ තනතුර ලබාදිය යුතු බවට තීරණය කරමි. පළමු වන පාර්ශ්වකරු සහකාර අධ්‍යක්ෂ තනතුරට 2024.09.25 වන දින උසස් වීම් ලබා ඇති නිසා එදින දක්වා කොට්ඨාස කළමනාකාර තනතුර පළමු වන පාර්ශ්වකරුට හිමිවිය යුතු වේ. ඒ අනුව 2021.08.10 දින සිට 2024.09.25 වන දින දක්වා වසර 3 යි මාස 1 යි දින 15 ක් කොට්ඨාස කළමනාකරණ තනතුර සඳහා වැටුප් හා දීමනා සඳහා පළමු වන පාර්ශ්වකරු හිමිකම් ලබයි.

මෙම විභාගයේ දී පළමු වන පාර්ශ්වකරුට හිමි විය යුතු මූල්‍යමය සහන පළමු වන පාර්ශ්වකරුගේ නියෝජිත විසින් සිය දෙවන ප්‍රකාශය සමග A -10 වශයෙන් සලකුණු කර 2025.04.30 වන දින මෙම බේරුම්කරණ ගොනුවට ගොනු කර ඇත. A -10 වශයෙන් සලකුණු කර ඇති එම ලේඛනය පළමු වන පාර්ශ්වකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිත විසින් අත්සන් කර නොතිබීම හේතුවෙන් එම ලේඛනය මත මූල්‍යමය ප්‍රදානය ලබාදීම ප්‍රතික්ෂේප කරමි. එම නිසා පළමු වන පාර්ශ්වකරුට ඉහත දැක් වූ පරිදි 2021.08.10 වන දින සිට 2024.09.25 වන දින දක්වා කොට්ඨාස කළමනාකරණ තනතුර හිමි විය යුතු බවට පමණක් තීරණය කරමි. ඒ අනුව මෙහි පළමු පාර්ශ්වය වන සී.ජේ. විජේවීර යන අයට මෙම කොට්ඨාස කළමනාකරණ තනතුර ලබාදී ඒ බව ඇඹිලිපිටිය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කළ යුතුය. එම කාලයට අදාළ වෙනත් ව්‍යවස්ථාපිත දීමනා වේ නම් ඒ සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවිය යුතුය.

ඉහත බේරුම්කරණ ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත බවට ප්‍රකාශ කරමි.

**ඩබ්.ඒ.ජයවික්‍රම,**
බේරුම්කරු.

2025 ජුලි මස 28 වැනි දින දීය.

EOG 08-0288

---

මගේ අංක - IR/COM/03/2022/167

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.07.21 දිනැති හා අංක 2446/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් උතුරු පයාගල, ගාලු පාර, අංක 45/A ලිපිනයෙහි පදිංචි පී. ඒ. ආර්. ජයසිංහ මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 130 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර පවත්නා කාර්මික

ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/43/2025 හා 2025.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025, අගෝස්තු මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දීය**

යොමු අංකය : IR/COM/03/2022/167
නඩු අංකය : A/43/2025

පී. ඒ. ආර්. ජයසිංහ මහතා,
අංක 45/ඒ,
ගාලු පාර, උතුරු පයාගල.

පළමු පාර්ශ්වය

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව,
අංක 130, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

දෙවන පාර්ශ්වය

**ප්‍රදානය**

ඉහත පාර්ශ්වයන් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ගරු කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 හා සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙතපැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණ වනුයේ;

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කළමනාකරණ සහකාර (විගණන ලිපිකරු) තනතුරෙහි සේවය කරන පී. ඒ. ආර්. ජයසිංහ මහතාට,

- 2021.05.11 දිනැති ලිපිය මගින් අමතර රාජකාරි පැවරුමක් ලෙස ගිණුම් නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ආවරණය සඳහා මාර්ග හා පාලම් අංශය වෙත ස්ථාන මාරු කිරීම.

- 2021.06.02 දින සිට නැවත අභ්‍යන්තර විගණන අංශය වෙත ස්ථාන මාරු කරනු ලැබ ඇතත් එහි සේවය කිරීමට අවස්ථාව නොදීම.

- 2021.06.07 දින සිට නැවත මානව සම්පත් හා පාලන අංශය වෙත අනුයුක්ත කිරීම.

- 2021.06.21 දින කළුතර මාර්ග සංවර්ධන වැඩ බිම වෙත ස්ථාන මාරු කිරීම.

- තනතුරට පරිබාහිර රාජකාරිවල යෙදවීම.

යනාදී ක්‍රියාවන් මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

**ප්‍රදානය**

2025.07.24 වැනි දින බේරුම්කරණ අංශයේ දින නියම වී තිබූ මෙම ආරාවුල සඳහා වගඋත්තරකාර පාර්ශ්වය එයට සම්බන්ධ නොවූ අතර මෙහි පළමු පාර්ශ්වය මෙම ආරාවුල ඉල්ලා අස්කර ගන්නා බව පවසන ලදී. ඒ බව 2025.07.24 වැනි දින බේරුම්කරණ අංශයට ලිඛිතව දන්වා ඇත.

මෙම කරුණු අනුව පැමිණිලි පාර්ශ්වය ආරාවුල ඉල්ලා අස්කරගැනීම හේතුවෙන් නඩු කටයුතු අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**සිරි සිංගප්පුලි,**
බේරුම්කරු.

2025 ජුලි මස 24 වැනි දින.
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 08-0289

---

මගේ අංක - IR/COM/01/N/2015/41

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.07 දිනැති හා අංක 2113/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අවිස්සාවේල්ල, සීතාවක, පරණ තොටුපල පාර, අංක 07 හි පදිංචි සුසන්ත ගජබා විජේසිංහ මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, රොක් හවුස් පටුමහ, අංක 15 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A18/2019 හා 2025.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025, අගෝස්තු මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණ ශාඛාව**

යොමු අංකය :IR/COM/01/N/2015/41
නඩු අංකය : A/18/2019

සුසන්ත ගජබා විජේසිංහ මහතා,
අංක 07, පරණ තොටුපල පාර,
සීතාවක,
අවිස්සාවේල්ල.

ඉල්ලුම්කාර පාර්ශ්වය

සහ

ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,රොක් හවුස් පටුමහ,
කොළඹ 15.

## ප්‍රදානය

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 , 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත පවරා ඇත.

පහත දැක්වෙන ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.02.28 වන දින මා පත් කරන ලද බව 2019.03.01 දිනැති ලිපියෙන් හා වෘත්තිය සබඳතා අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත දන්වා ඇත.

කම්කරු කොමසාරිස් ජෙනරාල් විසින් විසඳීමට මා වෙත යොමු කරන ලද ආරාවුල වන්නේ “සහකාර ආරක්ෂක අධ්‍යක්ෂවරයෙකු ලෙස මුලින්ම ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවයට පැමිණි සුසන්ත ගජබා විජේසිංහ වන මෙම පැමිණිලිකරු 1997.09.08 දින සිට යුධ හමුදා සක්‍රිය සේවයට ගොස් 2010.11.22 දින නැවත ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවයට පැමිණි පසු සහකාර ආරක්ෂක කළමණාකරු යන තනතුරේ පිහිටුවීම මගින් ආසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ ආසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ”

පළමු හා දෙවන පාර්ශ්වයන්ගේ තම දේශන හා සිය ප්‍රතිප්‍රකාශයන් ඉදිරිපත් කර එක් එක් පාර්ශ්වයන් අතර හුවමාරු කර ගැනීමෙන් පසු ඉල්ලුම්කරු වෙනුවෙන් පළමු දිනයේ නියෝජනයක් නැතත් දෙවන නඩු විභාග දිනයේ දී නීතිඥ සමන් ප්‍රියලාල් මහතා පෙනී සිටිමින් ද වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ එම් පායිස් මහතා පෙනී සිටිමින් ද 2021.03.18 දිනැති නිතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් නීතිඥ එම්. එම්. එන්. මොහිදීන් මහතා පෙනී සිටිමින් නඩුව විභාග කිරීම ආරම්භ කරන ලද අතර වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් 2022.02.18 වන දින නීතිඥ මලීෂා පැස්කුවෙල් පෙනී සිටින ලදී.

2021.02.15 දින නඩු විභාගයේ දී නඩුවේ ඉල්ලුම්කාර ගජබා විජේසිංහ අංක 1 - 20 දක්වා ලේඛන ඡායා පිටපත් ලකුණු කරමින් තම නඩුවේ සාක්ෂි ලබා දෙන ලදි. (ආරම්භයේදීම නියෝජිතයෙකු නොමැතිව පැමිණිලිකරු විසින්ම නඩුව ගෙන යාමේ දී ඔහුට ඇති විය හැකි අපහසුතා පැහැදිලි කර දෙන ලදි) 1995.04.29 වන දින දිනමිණ පුවත්පතේ පල වූ දැන්වීමකට අනුව ස්ථිර ආරක්ෂක අධ්‍යක්ෂ මෙහෙයුම් ධුරය සඳහා ඉල්ලුම් කළ බවත් ( ඒ - 1) එවකට ඔහු යුධ හමුදා නිලධාරියෙකු ලෙස පත් කළ අධිකාරි පත්‍රය (ඒ - 2) ලකුණු කරන ලදි. 1955.11.29 ලංකා ධීවර වරාය සංස්ථාවේ ආරක්ෂක අංශයක් පිහිටු වීමට අමාත්‍යාංශය දෙන ලද අනුමැති ලිපිය ( ඒ - 3 ) ලෙසත් 1993.03.06 දින නිකුත් කළ ගැසට් නිවේදනය අනුව ආරක්ෂක අංශයක් පිහිටුවූ බවත් ( ඒ - 4 ) (ඒ - 4 (1)) 1996.08.19 දින ඔහු සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ තනතුරේ තාවකාලිකව බඳවා ගන්නා බව (ඒ - 5 ) ලිපියෙන් දැන්වූ පසු 1996.09.02 දින යුධ හමුදාවෙන් නිත්‍යානුකූල අවසරයෙන් සක්‍රිය සේවයෙන් මිදී (ඒ - 6 ) ලිපියෙන් ලංකා වරාය නීතිගත සංස්ථාවේ ආරක්ෂක අංශයේ වැඩ භාර ගෙන 1997.01.01 සිට බල පැවැත්වෙන පරිදි සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ ධුරයේ පත්වීමේ ලිපිය 1997.06.18 වන දින (ඒ - 7) මගින් ලබා දී ඇත. ඒ සඳහා වූ හැඳුනුම්පත ( ඒ - 8) 1997.09.08 දින හමුදා පනතේ 144 (1) යටතේ සක්‍රිය සේවයට කැඳවූ පසු සක්‍රිය සේවයට වාර්තා කර ඇත (ඒ - 10) ඒ අනුව සහකාර ආරක්ෂක අධ්‍යක්ෂවරයා ලෙස වැටුප් ලබා රාජකාරි කළ බවට (ඒ - 13) ලේඛනය ඉදිරිපත් කර ඇත. එසේ රාජකාරි ඉටු කරමින් සිටිය දී 2010.12.27 දින දරන ලිපියෙන් ඉල්ලුම්කරුගේ තනතුරු නාමය සහකාර ආරක්ෂක කළමනාකරු ලෙස සංශෝධනය කර ඇති බවත් (ඒ - 14). ඒ අනුව වැටුප සහකාර ආරක්ෂක කළමණාකරු ලෙස සටහන් කර නිකුත් කළ බවත් (ඒ - 15) හා (ඒ - 15 (1) ) න් එම වැටුප රු.26,160.00 වන අතර පෙර වැටුපට වඩා අඩු බවත් මේ පිළිබඳව එවකට සිටි සභාපතිවරයාට දැනුවත් කළ බවත් 2011.03.10 දින එස්. ජී. විජේසිංහ සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ ලෙස ආගමන විගමන දෙපාර්තමේන්තුවට දන්වා තිරු බඳු රහිතව වාහනයක් ලබා දී ඇත. (ඒ - 17) ඉල්ලුම්කරුගේ තනතුර පිළිබඳව මූලික අයිතිවාසිකම් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු ගත කළත් එය කාලාවරෝධී වීම මත ඉවත දැමීමෙන් පසු මෙම ඉල්ලීම කරන ලද බවත් සහකාර කම්කරු කොමසාරිස් විසින් එවකට සාමාන්‍යාධිකාරිව සිටි පී බී අබේසේකර මහතා සහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සමඟ සාකච්ඡාවේදී එකඟතාවය මත තනතුර ලබා දීමට එකඟතාවය පළ කරන ලදි. (ඒ - 18) අදාළ තනතුර ලබා දීම ප්‍රමාද වූ විට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා 2015.10.15 දින (ඒ - 19) ලිපියෙන් දැන්වූ පසු සහකාර කම්කරු කොමසාරිස් ආමන්ත්‍රණය කරමින් සහකාර ආරක්ෂක ධුරය ලබා දීම සඳහා කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවට අදාළ ලේඛන යවා ඇති බව දන්වා ඇත. (ඒ - 20)

2021.03.18 දින නැවත විභාගය ආරම්භ කිරීමේ දී නීතිඥ සමන් ප්‍රියලාල් මහතා පැමිණිලිකරු වෙනුවෙන් පෙනී සිට පැමිණිල්ල මෙහෙය වන ලදි. 2015.11.24 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තිරණය (ඒ - 21) අනුව සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ තනතුර ඉල්ලුම්කරුට පුද්ගලික වන සේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති බවත් එසේ ඉල්ලූ ලේඛනය ( ඒ - 22 හා ඒ - 22(ඒ)) බවත් කියා සිටී. එසේම (ඒ 22 ( බී )) මගින් ඉල්ලුම්කරුගේ තනතුර වන අතිරේක අධ්‍යක්ෂ ධුරය අතිරේක සාමාන්‍යාධිකාරි පාලන ධුරය සඳහා ඉල්ලුම් කරන ලෙස කළමනාකරණ සේවා අනුමැතිය ඉල්ලා ඇති බව ය. ( ඒ - 22(සී)) මගින් පෙන්වා දෙන්නේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා කම්කරු හා කාර්මික අධිකරණයේ පැවති සාකච්ඡාව පරිදි ඇති වූ එකඟතාවය මත ඔබට වැටුප් වර්ධක හා

සහකාර අධ්‍යක්ෂ ධූරයේ පිහිටුවා උසස් වීම් ලබා දෙන ලෙසත් ඒ අනුව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගන්නා ලෙසත්ය. සභාපතිවරයා විසින් අභ්‍යන්තර බඳවා ගැනීම යටතේ සමානාධිකාරි තනතුරට සුදුසු බවත් (ඒ - 22 (ඩී)) මගින් තහවුරු කර ඇත. 2017.10.25 දරන 5/2017 චක්‍රලේඛනය ( ඒ - 23 ) අනුව තමාට වෘත්තීය දීමනාව ලැබෙන්න තිබෙන බව කියා සිටින ලදි. නමුත් රු.15,000.00 ක මුදලක් ලැබිය යුතු වුවත් ලබා දෙන්නේ රු.5,000.00 ක් බවයි. ( ඒ - 24, ඒ - 25, ඒ - 26) ලේඛන මගින් සභාපති ඉල්ලුම්කරු හා ජලජ සම්පත් අංශයේ ලේකම් හා කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර හුවමාරු ලේඛන මගින් උසස් වීම් ලබා දීම හා තනතුර සහ වැටුප් තලයේ පිහිටුවීම සම්බන්ධ අදහස වුවත් අද වනතුරු අවුරුදු 23 ක සේවා කාලය වෙනුවෙන් ලැබිය යුතු සේවා දීමනා ලැබී නැත. ඒ -27, ඒ - 28, ඒ - 28(ඒ), ඒ - 28 (බී), ඒ - 29 ලේඛන මගින් හමුදා සේවයෙන් නිදහස් කළ අයෙකුගේ උසස් වීම්, වැටුප් ගැන සඳහන් කර ඇති බවත් අංක 30 දරන කළමනාකරන සේවා චක්‍රලේඛනයේ 4 වන ඡේදයේ දැනට එම තනතුරු දරන්නාට පමණක් පෞද්ගලික වන සේ අන්තර්ග්‍රණය කිරීමත් නව බඳවා ගැනීම් එම තනතුර සඳහා නොකළ යුතු බවත් එම තනතුරු දරන්නා දැනට දරන තනතුරෙන් වෙනත් තනතුරකට උසස් කිරිම හෝ විශ්‍රාම යාමෙන් පසු තනතුර අහෝසි වන බවත් පෙන්වා දී ඇත. ඒ - 29 මගින් නිවැරදි වැටුප් තලයේ තබා නැති බවත්ය.

2009.02.20 දින *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 136 වගන්තිය අනුව (ඒ - 30 ), ඒ - 30 (ඒ) යටතේ විනය හේතුවක් නොමැති නම් රජයේ සේවයේ යෙදුන අයෙකු නැවත නීත්‍යානුකූලව පැමිණීමට ජොෂ්ඨත්වය එලෙසම පවතින බව කියා සිටී. ඒ - 32 ලේඛනය ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම් ඇතුළු සංස්ථාවේ ප්‍රධාන නිලධාරින් පැවැත්වූ සාකච්ඡා වාර්ථාව අනුව සේවයෙන් ඉවත්ව ගියා කියා සඳහන් වුවත් තමා යුධ හමුදා අණදෙන නිලධාරිගෙන් සක්‍රීය සේවය සඳහා මුදා හරින ලෙස සභාපතිවරයා විසින් කරන ලද ඉල්ලීම අනුව නිදහස් කළ බවයි. එසේම හිමි නොවන තනතුරු නාමයන් භාවිතා කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 48 වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට නියම කර ඇති බවත් ඒ - 32 (බී) මගින් පෙන්වා ඇත. එම විනය පරීක්ෂණය අනුව ඉල්ලුම්කරුට අසාධාරණයක් වී ඇති බවත් තිරණය කළ බව ඒ - 32 (ඒ) මගින් පෙන්වා ඇත. එසේම නැවත සේවයට වාර්තා කිරීමේ දී තනතුර ලබා දුන්නත් ඔහුට ලැබෙන වරප්‍රසාද අහිමි වන බවත් එසේම 2006/30 චක්‍රලේඛනය අනුව ඉල්ලුම්කරු සිටි තනතුර හා වැටුප් තලය වෙනස් වී ඇති බවත් තීරු බදු රහිත වාහන ආදිය අහිමි වී ඇති බවත්ය. ඒ - 33 ඉදිරිපත් කරමින් ලබා දෙන වැටුප් තලය නිවැරදි නොවන බවත් දැනට ගෙවන වැටුපට වඩා වැඩිවිය යුතු බවත් 2008.07.01 වන දින සිට කළමනාකරන චක්‍රලේඛනය අනුව ගෙවිය යුතුව ඇතත් එතෙක් ගෙවූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ගෙවන බවත් කියා සිටී. 2002.01.01 දිනට සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ පළමු වන ශ්‍රේණියටත් 2007.01.01 දින වන විට ආරක්ෂක අධ්‍යක්ෂ ලෙස 2006.06.10 චක්‍රලේඛන අනුව අන්තර්ග්‍රහණයේ දී අතිරේක සමානාධිකාරි තනතුරට අවම ලෙස සමාන්තර විය යුතු බවත් 1972.03.22 දින කැබිනට් මණ්ඩල තිරණය අනුව ස්වේච්ඡා වෙන් උසස් වීම් ලබා දීමේ දී වැඩි සැලකිලි දැක්විය යුතු බවත් සඳහන් කර ඇති බව කියා ඇත. ඒ බවට ඒ - 33 ( බී) ලකුණු කරන ලදි. ඉල්ලුම්කරු තමා හට හිමි විය යුතු හිමිකම් හා දීමනා ඒ - 33 ( සී ) ලෙස සලකුණු කරන ලදි. ප්‍රවාහන දීමනා, දුරකථන දිමනාව, වෛද්‍ය දීමනා, වෛද්‍ය නිවාඩු දීමනා හමුදා සක්‍රීය සේවා කාලය, සිවිල් රැකියාවේ සක්‍රීය සේවා කාලය හා එක්ව ලබා දිය යුතු බවත් වෘත්තිය දීමනාව ලබා දෙන්නේ නව බඳවා ගත් අයෙකු ලෙසටය.

ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටියේ 1995.04.29 දින දිනමිණ පුවත්පතේ පළ වූ ස්ථිර නිලධාරි බඳවා ගැනීමේ තනතුරුවලට අනුව සංස්ථාවේ ස්ථිර ආරක්ෂක සේවයක් පවත්වා ගෙන යාමට කැබිනට් අනුමැතිය අනුව වෘත්තියේ දියුණුව හා පුහුණු කටයුතු කිරිම සඳහා එවකට අමාත්‍යාංශ ලේකම්වරයා ඉල්ලුම්කරුව කොන්ත්‍රාත් පදනම මත ආරක්ෂක අධ්‍යක්ෂ මෙහෙයුම් තනතුර ලබා දුන් බවත් ආර් - 2 නැතිනම් ඒ - 7 අනුව 1997.01.01 දින සිට සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ ධූරයට ස්ථිර කළ බවත් ආර් - 3 ලේඛනයට අනුව සුදුසුකම් හා හමුදා සේවය තිබු බවත් එම වර්ෂයේ දීම (1997) හමුදා සක්‍රීය සේවයට මුදාහැරි බවත් වර්ෂ 13 කට පසු (ආර් - 4) සභාපතිගේ ඉල්ලීම මත නැවත සංස්ථාවේ සේවයට පැමිණි බවත් ආර් - 5 අනුව එවකට තිබූ පටිපාටිය අනුව තනතුරු නාමය වෙනස් කර ඇති බව පිළිගනී. නමුත් මුල් පත්වීම ආර් - 2 ට අනුව පත්වීම ලබා ඇති බව පිළිගනී. ඒ අනුව ඒ - 33 සහ ඒ - 33 (ඒ), ඒ - 33 (බී), ඒ - 33 ( සී) යන ලේඛන අනුව ඔහු දන්නා තරමින් වැටුප් සකස් කරන ආකාරය නිවැරදි නොවන බවත් ඔහුගේ පත්වීම් ලිපිය අනුව ශ්‍රේණි ගත කිරීම් අනුව වර්තමානය වන විට චක්‍රලේඛනයට අනුව වැටුප් සකස් කළ බවත්ය. "වගඋත්තරකාර ආයතනය කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුව එම චක්‍රලේඛන අනුව කටයුතු නොකිරීම නිසා හා මා යුධ හමුදා සක්‍රීය සේවයේ සිට නැවත ලංකා ධීවර නීතිගත සංස්ථාවට වාර්තා කිරීමේ දී ඊට අනුගත වන කාර්ය පටිපාටින්ට හා නියමිත රෙගුලාසි වලට අනුව කටයුතු නොකිරීම මත මා ගරු අධිකරණයට පැමිණියේ"

ආර් - 6, ආර් - 7 ලේඛන අනුව වැටුප් ගෙවීම මත තමා සිටිය යුතු වන්නේ 2006/30 අනුව එච් එම් 1.3 කාණ්ඩය බවයි. ඒ - 28 සහ ඒ - 28(ඒ) අනුව අමාත්‍යාංශ ලේකම් හා කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් අත්සන් කළ ලිපිය අනුව ප්‍රතිව්‍යුහගත කර නැති බව එක එල්ලේම තහවුරු වෙයි. වැටුප් ගැන ප්‍රශ්නය විත්ති පක්ෂය උලුප්පා පෙන්නුවත් තනතුර නිසි ලෙස තහවුරු කර වැටුප සකස් කළ බවත් නොකියයි. ඒ 28 තනතුරු නාම ලැයිස්තුවක් තිබුණත් ඒ - 28 (ඒ) හි එය සහකාර ආරක්ෂක අධ්‍යක්ෂ තනතුර ඇතුළත් වුවත් ඔහු එම නිසි කාලයේ නොපිහිටු වීම මගේ වරදක් නොවේ. එය පරිපාලන වශයෙන් කර ඇති වරදකි" යන්න හරස් ප්‍රශ්න වලදී පිළිතුරු දී ඇත.

ප්‍රතිව්‍යුහගත කිරීමේ දී ආයතනයේ නොමැති තනතුරු නාමයක් ලබා දීම වගඋත්තරකාර ආයතනයට නොහැකි බව යෝජනා කළත් ආයතනය විසින් මෙම තනතුර පිළිබඳව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවට කරන ලද ඉල්ලීමේ ද ඇතුළත් කිරීමෙන් වැලකී සිටි බවට ගරු අධිකරණයට ප්‍රකාශ කරයි'' පිළිතුරු දී ඇත. නැවතත් " මා යුධ හමුදා සක්‍රීය සේවයේ යෙදුන නිලධාරියෙක් ලෙස යුද්ධ හමුදා පනතේ 144 වගන්තිය ප්‍රකාර සහ 1972.03.22 දින ස්වේච්ඡා නිලධාරින් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මා හට හිමි වරප්‍රසාද අහිමි කිරිමකි'' යන පිළිතුර හරස් ප්‍රශ්න වලදී දී ඇත.

IR/COM/01/N/2015/41 දරන කාර්මික ආරාවුලේ ඇති වූ ආර් - 8 දරන සමථය අනුව කටයුතු කර ඇති බවත් ආර් - 9 2007, 2008, 2009, 2010 වර්ෂ වල අදාළ වැටුප් ලබා දෙන ලද බවත් යෝජනා කළත් "නැහැ" යන පිළිතුර දී ඇත. 1997.01.01 සිට මගේ වැටුප නිවැරදි කර දෙන ලෙස සහ හිමි ජ්‍යොෂ්ඨත්වය ලබා දෙන ලෙසත් 2006/30 චක්‍රලේඛනය අනුව සුදුසු තනතුරේ පිහිටු වන ලෙසත් එවකට සිටි සභාපතිතුමාට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ බව මතක බව'' හරස් ප්‍රශ්න වලට පිළිතුරු දී ඇත.

1997.01.01 සිට මගේ වැටුප නිවැරදි කරන ලෙස හා හිමි ජ්‍යොෂ්ඨත්වය ලබා දෙන ලෙසත් 2006/30 චක්‍රලේඛනය අනුව සුදුසු තනතුරේ පිහිටුවන ලෙසත් එවකට සිටි සභාපතිතුමාට ලිඛිතව ලිපියක් මගින් කරුණු ඉදිරිපත් කළ බව මතක යැයි හරස් ප්‍රශ්න වලට පිළිතුරු දී ඇත.

ආර් - 9, ආර් - 10, ආර් - 11, ආර් - 12 ලේඛන ගැන හරස් ප්‍රශ්නවලට එකඟ නැති බවත් වැටුප ගෙවා ඇත්තේ පහත ශ්‍රේණියක බවත් "නමුත් මගේ නිවැරදි වැටුප හා නිල බල ක්‍රමවේදය තුළ මා සිටිය යුතු ස්ථානය මේ ලේඛනය අනුව නිවැරදි නොවේ'' යැයි සාක්ෂි දී ඇත. ආර් - 13 ලෙස ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛනය ඉදිරිපත් කරමින් එම ඉල්ලීම කාලාවරෝධී වී ඇති බවත් විත්ති පාර්ශ්වය කීවත් එවැනි විටදී විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට නීතියෙන් ඉඩ තිබේ නම් එසේ කර ඇති බව පෙනී යයි.

නැවත ප්‍රශ්න කිරීමේ නැවත සංස්ථාවට වාර්තා කළේ සභාපතිගේ ඉල්ලීම අනුව යුද්ධ හමුදාවෙන් නිදහස් කිරීම නිසා බවත් 2010.11.22 සේවයට වාර්තා කළ බවත් තනතුර සංශෝධනය කර ඇත්තේ 2010.12.27 වන දින බවත් පිළිතුරු දී ඇත. ආර් - 6, ආර් - 7 දරන ලේඛනවල වැටුප් ගෙවීමත් නිවැරදි නොවන බව නැවතත් සාක්ෂි දෙමින් කියා ඇත. ආර් - 8 සමථය අනුව නිසි තනතුරේ තැබිය යුතු බව පිළිගෙන ඇති බවත් කියා සිටින ලදි. ආර් - 9, ආර් - 10, ආර් - 11 නැවතත් ප්‍රතික්ෂේප කර සිටින ලදි. ආර් - 12 දරන මානව හිමිකම් නඩුව කාලාවරෝධය මත ප්‍රතික්ෂේප කරන ලද බවත් පී - 12 ලේඛනයෙන් ඉදිරිපත් කළ බවත් කියා සිටින ලදි.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් වැඩ බලන මානව සම්පත් කළමනාකාර සිසිල් විජේතුංග සාක්ෂි දෙමින් තනතුරු නාමය සංශෝධනය කරන ලද බවත් ඒ අනුව වැටුප් ගෙවූ බවත් එය ආර් - 02 මුල් පත්වීම් ලිපියේ කොන්දේසි අනුව පවත්වා ගෙන ගිය බවත් තනතුරු නාමය සංශෝධනය කර ඇත්තේ 2013.01.17 දිනැති අනුමත සේවක අවශ්‍යතා ලේඛනයේ (ආර් - 20) අනුව බවයි. 1996.09.02 දින සේවක මහතා යුධහමුදා සේවයෙන් නිත්‍යානුකූල සේවයට පැමිණි බවත් ආර් - 2 ට අනුව 1997.01.01 දින සිට ස්ථිර සේවයට පත් වූ බවත් එය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/92 අනුව දෙවන පන්තියේ 2 වන ශ්‍රේණියේ ඒ - 5 (ඒ) වැටුප් සංශෝධනයට අදාළව මුල් බඳවා ගැනීම් කර ඇත. එනම් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2 වන ශ්‍රේණියේ වැටුප් තලයේ ද යන ප්‍රශ්නයට උත්තර "ඔව්'' යැයි පිළිතුරු දී ඇත. (ආර් -16) කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ සංශෝධනය වීමට පෙර එය ඇති වූ 2013 ට පෙර ක්‍රියාත්මක වූ බඳවා ගැනීමේ පටිපාටියේ 2002 අනුමත කිරීමට යෝජිත පටිපාටිය තිබිය දී ආර් - 5 අනුව තනතුරු නාමය සංශෝධනය කර ඇත.

එය නිවැරදි බව පැහැදිලි කිරීමට සාක්ෂිකරුට නොහැකි විය. 2013 දී සංශෝධනය 2010 පදනම් කර නැති බවට පිළිගනි. " පවතින අවශ්‍යතාවය මත ආයතනයේ අවශ්‍යතාවය මත පාලන අධිකාරියේ අවශ්‍යතාවය මත ගැලපීම කරලා තියෙන බව'' සාක්ෂිකරු කියා සිටී. පාලන අධිකාරියට වැරදි තිරණයක් ගැනීමේ හැකියාවක් නොමැති බව ද පිළිගෙන ඇත.

කුමන තනතුරකට නිදහස් කරනවා දැයි ආරක්ෂක ලේකම්ට අදාළ දැයි ඇසූ ප්‍රශ්නයට පිළිතුර වූයේ " ආරක්ෂක ලේකම්ට අදාළ නැත " යන්නයි. නමුත් ආර් - 4 ලිපිය පරිදි යුධ හමුදාවේ සක්‍රීය සේවයේ සිටින මොන තනතුරේ අයෙකු වුවත් ඉල්ලීම අනුව සිටින තනතුරෙන් නිදහස් කරනවා'' ඔහු අලුත් තනතුරකට නිදහස් කිරිමක් සිදු නොවේ. ආර් - 20 ලේඛනය 2013 දී පදනම් කර ගන්නේ සංස්ථාව දුන්න තොරතුරු අනුවත් යන ප්‍රශ්නයට " ඔව්'' යැයි පවසයි. සංස්ථාව ඉල්ලුම්කර සිටින තනතුරක් තිබුණ බවට තොරතුරු කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නැති බවට පිළිගනි. එම නිසා ආර් - 20 ලේඛනයේ ඉල්ලුම්කරුගේ තනතුරු නාමය එච් එම් 1 - 1 හෝ එම් එම් 1 - 1 කොට්ඨාසය තුළ ඇතුළත් නොවන්නේ ද? පිළිතුර " ඔව්'' යන්නයි. එම වැරදි නිවැරදි කරන ලෙසට සාමාන්‍යාධිකාරිවරයාට 2015.11.24 දිනැති 224 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2015.10.24 දින විෂය යටතේ තිරණය කර කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට යොමු කර ඇති බව (ඒ - 20) දක්වා ඇතත් පසුවිපරමක් කර නැත.

සාක්ෂිකරු විවිධ වැටුප් තල ගැන විවිධ ආකාරයට සාක්ෂි දී තිබේ. මා හට සාක්ෂිකරු පරස්පර සාක්ෂි ලබා දෙන බවට පෙනී යයි. (ආර් - 9

ආර් - 10) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හෝ කළමනාකරණ චක්‍රලේඛ පෙන්වා පැමිණිලිකරු ප්‍රශ්න නැගීමේ දී එක උත්තරයකුත් සංස්ථා පාර්ශ්වයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී තව ආකාරයකටත් පරස්පර සාක්ෂි දෙන බව සාක්ෂි සටහන් වලින් තහවුරු වෙයි. 2023.05.15 දින හරස් ප්‍රශ්න වලදී ''පහළ මට්ටමේ කළමනාකරුවෙකුගේ නිලයකට තමයි ඉල්ලුම්කරුට ආදේශ කළේ පිළිතුර ඔව් සමාගමේ සහකාර ආරක්ෂක කළමනාකරුවන් සහ සාමාන්‍යාධිකාරි යන වැටුප් පරිමාණයකට අදාළව'' වැටුප් ගැලපීම නිවැරදි නොවන බව හරස් ප්‍රශ්න වලදී පෙන්වා දුන්නත් එය පිළිගැනීමට හැකියාවක් නැත'' කියා පිළිතුරු දී ඇත. 2023.11.05 දින හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ප්‍රශ්නය මහත්තයා මුලදිම පිළිගත්තා ඉල්ලුම්කරුට ලබා දිය යුතු ශ්‍රේණියක් තිබුණේ නැහැ කියා. පිළිතුර '' ඔව් '' ප්‍රශ්නය '' එතකොට ඒ ශ්‍රේණිය ලබා නොදීම මත නියමිතවැටුප් කාණ්ඩය පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා නේද? පිළිතුර ''ඔව්'' ඒ අනුව T5 - 1 නොව T6 - 1 -1 කියන වැටුප් කාණ්ඩය කියලා යෝජනා කළ විට පිළිගැනීමට හැකියාවක් නැතැයි පිළිතුරු දී ඇත. වසර 5 කට වරක් ශ්‍රේණි ගත කිරීමේ දී ඉල්ලුම්කරුට 2010 සිට ගණන් ගැනීම වැරදි බවත් ඉල්ලුම්කරු 1996 සිටම සේවය කළ බව පිළිගනී. ඒ අනුව ගණනය කිරීම වැරදි බව යෝජනා කළ විට ''පිළිනොගන්නා ලදී'' (ආර් - 21) ඉල්ලුම්කරු ආර් - 27, ආර් - 28 ලිපි මගින් ආරක්ෂක කළමනාකරු ලෙස අයඳුම්කර තිබීමට හේතුව එම අවස්ථාවේ දී තිබූ තනතුර අනුව ඉල්ලුම්කරු කර ඇති බව පෙනේ. ඔහුට ''නැති තනතුරකින් ලිපි ලියන්න බැරි නිසා නේද'' පිළිතුර ''ඔව්'' ප්‍රශ්නය ආර් - 31 න් කරන ලද ගෙවීම් බේරුම්කරණය ඉදිරියට පවත්වා ගෙන යාමට සම්බන්ධ නැති බව යෝජනා කළ විට උත්තරය සලකා බැලීමේ දී නැත කියා පිළිගනී 2023.10.10 දින හරස් ප්‍රශ්න වලදී ඒ - 40 දූරකථන දීමනාව නිවැරදිව ගණනය කර ඇති බව පිළිගනී නමුත් ඒ - 41, ඒ - 42, ඒ - 43, ඒ - 44 වෘත්තිය හා ප්‍රවාහන ඉන්ධන හිඟ වැටුප වන මුළු මුදල රු. 17,740,216.57 වෙයි. එහෙත් ඒ - 40 හැර ඒ - 41, ඒ - 42, ඒ - 43, ඒ - 44 යන දීමනා පිළිනොගන්නේ ටී 5 - 1 අනුව වැටුප් සකස් කළ යුතුයි. නමුත් ඔහු පරිපාලන සේවයට ගැනෙන අයෙකු නිසා ටී 6 යටතේ ගණනය කළ යුතුව තිබූ බව මා හට ද පෙනී යයි. (ඉදිරිපත් කර ඇති චක්‍රලේඛනය අනුව)

මෙම නඩුවට අදාළව ඉදිරිපත් කරන ලද සියළුම සහ ලිඛිත ප්‍රකාශයන් අනුව එනම් යුධ හමුදා පනතේ 1972 මාර්තු 22 කැබිනට් තීරණයේ 144(1) වගන්තියට අනුව අනිවාර්යෙන්ම සිටිය යුතු තනතුරේ තැබිය යුතු වීමත් මේ පිළිබඳව SCH/R/අංක 30 14 ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවෙන් පැහැදිලි කර ඇති අයුරින් (වයි ලේඛනය) පරිපාලන දෝශ සඳහා සේවකයින් වගකිය යුතු නොවන බැවිනුත් කාර්මික සබඳතා අංශයේ IR/COM/01/2015/41 සහ 2015.08.15 දිනැති ලිපිය අනුවත් වින්තිකාර ආයතනයේ සභාපති විසින් 2019.10.31 දින කළමනාකාරන සේවා දෙපාර්තමේන්තුවේ ලේකම් වෙත යවන ලද ලිපිය අනුවත් ඒ 22, ඒ - 22 (ඒ), ඒ -22 (බී), ඒ - 22 ( සී) සහ ඒ - 22 (ඩී ) ලෙස ලකුණු කරන ලද ඡේද අනුවත් මොහු හට 30/2006 චක්‍රලේඛනයට අනුව 2007.07.01 දින සිට අතිරේක සමාන්‍යාධිකාරි (පාලන) තනතුරට පත් කරන ලෙසත් ඉහත සඳහන් කළ රු. 17,740,216.57 ක (රුපියල් දාහත් මිලියන හත්ලක්ෂ හතලිස් දහස් දෙසිය දාසයයි ශත පනස් හත ) මුදල ඉල්ලුම්කරුට ලබා දිය යුතු බවට නියම කරමි.

එම අදාළ මුදල මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පල වී මසක් තුළ උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට ද මෙයින් නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**නිතීඥ ආර්. එස්. ආරියප්පෙරුම,**
බේරුම්කරු.

2025 ජුලි මස 24 වන දින දී.
බේරුම්කරණ හා කර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 08-0290

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.